# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2173/13 - 2020 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2020.04.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**ඩලස් අලහප්පෙරුම** (පා.ම.),
අධ්‍යාපන, ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍ය.

2020 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත දැක්වෙන පරිදි 2020 වර්ෂයට අදාළව පමණක් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

- III වන උපලේඛනයේ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල ව්‍යවස්ථාවට අදළ විධිවිධාන යටතේ (අ) ඡේදයේ මැයි මස තිස් එක්වන දිනය යන වචන ඉවත් කොට අගෝස්තු මස තිස් එක්වන දිනය යන වචන ආදේශ කිරීමෙන්,

(2021 වර්ෂයේ ජනවාරි මස පළමු වැනි දින සිට නැවතත් 2016 ඔක්තෝබර් මස 27 වැනි දින දින අංක 1990/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* III වන උපලේඛනයේ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල ව්‍යවස්ථාවට අදළ විධිවිධාන යටතේ නිකුත් කර ඇති (අ) ඡේදය නැවත වලංගු වනු ඇත.)

02. 2020 මාර්තු මස 10 වන දින අංක 2166/9 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද සංශෝධිත ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන් හි අංක 01හි (ආ) ඡේදයට අයත් තේරීම් කමිටු නියෝග 2021 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

1A - G 32230 — 27 (2020/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*